<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.12.03</u>
<u>පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)</u>

2024 වර්ෂයේ IV කාර්තු වෙනි IV වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.12.03 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2024.12.03 වන දින ප.ව.2.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්‍ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාංශය (බ.ප.)
04. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය.
05. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ජේ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. ඩී.පී.මානවඩු මයා - මුලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. කේ.කේ.පී.රණතුංග මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
10. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
11. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරී පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
12. කේ.එල්.එම්.සඳරුවණි - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)

**ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.**

13. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
14. පී.ඩී,ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
15. ජේ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
16. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
17. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
18. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
19. ඉනෝකා කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
20. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
21. ජී.ජී.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
22. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
23. එච්.එස්.චන්දන මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
24. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
25. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම</td><td>බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් සෑම මසකම ඊලග මස 15 දිනට පෙර අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස නැවතත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදී.<br><br>මේ වන විට සියළුම කාර්යාල විසින් බැංකු සැසඳුම් මෘදු පිටපත නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලයට එවා ඇති බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ හඳුනා නොගත් ගෙවීම් දෙකක් ඇති බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී.<br><br>එම ගෙවීම් දෙක ගණකාධිකාරි සමඟ සාකච්ඡාකර විසඳා ගැනිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් බියගම ප්‍රාදේශීය ඉංජිනේරු දැනුවත් කරන ලදී.</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
<tr><td>02</td><td>අත්තිකාරම් ‘බී’ ගිණුමට අදාලව ණය අය නොවීම.</td><td>2024.11.30 දිනට නොපියවා ඇති ණය අයවීම් පිළිබඳ වාර්තාව
<table>
<tr><th>අනු අංකය</th><th>නිලධාරිගේ නම</th><th>තනතුර</th><th>ස්ථාන මාරුවී ගිය දිනය</th><th>2024.11.30 දිනට අයවීමට ඇත ණය ශේෂය රු.</th></tr>
<tr><td></td><td colspan="4">පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්</td></tr>
<tr><td>1</td><td rowspan="2">ඩබ්.ඒ.වී.එස්. වනිගසුන්දර මිය</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.01.01</td><td>රු.114,185.00</td></tr>
<tr><td></td><td colspan="3">මාසික වාරික වශයෙන් නිරවුල් වන දේපළ ණය ශේෂයක් වන අතර සම්පූර්ණ ණය ශේෂය පියවීමට මෙතෙක් කටයුතු කර නොමැත.</td></tr>
<tr><td>2</td><td rowspan="2">අයි.පී.ආර්.පෙරේරා මිය</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.02.17</td><td>රු. 3,000.00</td></tr>
<tr><td></td><td colspan="3">තවදුරටත් අය විය යුතු ණය ශේෂය රු.3,000.00 ක් වන අතර එම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කරන ලෙස 2024.10.09 හා 2024.11.04 දිනැති ලිපි මඟින් කොළඹ මහා නගර සභාව වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td>3</td><td rowspan="2">පී.ජී.එල්.ආලෝකා මිය</td><td>තාක්ෂණ නිළධාරි</td><td>2020.02.10</td><td>රු.99,376.00</td></tr>
<tr><td></td><td colspan="3">මාසික වාරික වශයෙන් නිරවුල් වන ආපදා ණය ශේෂයක් වන අතර සම්පූර්ණ ණය ශේෂය පියවීමට මෙතෙක් කටයුතු කර නොමැති බැවින් එම ණය ශේෂය එකවර පියවීමට කටයුතු කරන ලෙස 2024.10.29 දිනැති ලිපියෙන් මොරටුව මහා නගර සභාව වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td>4</td><td rowspan="2">ආර්.පී.එස්.විදුරංග මයා</td><td>කළමනාකරණ සේවා නිලධාරි</td><td>2023.07.17</td><td>රු. 214,961.00</td></tr>
<tr><td></td><td colspan="3">2024.06.08 දින සිට සේවය හැර යාමේ නිවේදන නිකුත් කර ඇත. සේවය හැර ගොස් ඇත්තේ කොළඹ මහා නගර සභාවේ සේවයකරන කාල සීමාව තුල දී බැවින් මෙම කාර්යාංශයේ ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙසත්, ණය අය කර ගැනීමට අදාල නීතිමය කටයුතු සිදු කරන ලෙසත්, 2024.10.09 හා 2024.11.04 දිනැති ලිපි මඟින් කොළඹ මහා නගර සභාව වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td></td><td colspan="3">එකතුව</td><td>440,765.00</td></tr>
</table></td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | **රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශගත සේවය සඳහා** | | | |
| 5 | එම්.එච්.ගුණසේකර මිය | කළමනාකරණ සේවා නිලධාරි | 2020.02.07 | 86,400.00 |
| | | රු.7,800/- බැගින් කාර්තු වශයෙන් ණයවාරික නිරවුල් කරනු ලබයි. | | |
| | **සේවය හැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ** | | | |
| 6 | ආර්.ඒ.එම්.එම්. රණසිංහ මිය | තාක්ෂණ නිලධාරී | 2013. 1.15 | 119,689.00 |
| | | මෙම නිලධාරිනියගේ ණය අය කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීති ක්‍රියාවලිය පිළිබඳ වත්මන් ප්‍රගතිය CSWP/ENG-ADM/26-8/FI/1 හා 2024.11.01 දිනැති ලිපිය මගින් ප්‍රධාන නීති නිලධාරි වෙතින් විමසා ඇත. නැවත නිතිර නිලධාරිගෙන් විමසිමට තිරණය විය. | | |

කොළඹ නගර සභාවේ රෝග නිවාරණ දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගිය කළමනාකරණ සේවා නිලධාරි අයි.පී.ආර්.පෙරේරා මියගෙන් තවදුරටත් අයවිය යුතු රු.3,000.00 මුදල සම්බන්ධයෙන් කොළඹ නගර සභාව වෙතින් දුරකථන මාර්ගයෙන් හෝ කතාකර එම වාරිකය පියවා ගැනිමට ඉදිරි කටයුතු සිදු කිරමට තීරණය විය

මේ වන විට 2024.06.08 දින සිට සේවය හැර යාමේ නිවේදන නිකුත් කර ඇති කොළඹ නගර සභාවට ස්ථාන මාරු වී ගිය කළමානකාරණ සේවා නිලධාරි ආර්.පී.එස්.විදුරංග මයා අවසන් වරට සේවයේ යෙදි සිටියේ කොළඹ මහ නගර සභාවේ බැවින් ණය ඔහු විසින් ලබා ගෙන ඇති ණය මුදල අයකර ගැනිමට අදාල නීතිමය ඉදිරි කටයුතු එම කාර්යාලයෙන් සිදු කළ යුතු බැවින් මෙම නිලධාරියා විසින් ලබා ගෙන ඇති ණය මුදල අයකර ගැනිමට නීතිමය ක්‍රියාමාර්ග ගැන්මට අවශ්‍ය ක්‍රියා මාර්ග යන්නා ලෙස කොළඹ මහ නගර සභාව වෙත නැවතත් දන්වා යවන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි.

**03** කල් ඉකුත්වූ තැන්පතු

| | ආයතනයේ නම | | තැන්පත් දිනය | තැන්පත්කරුගේ නම | වටිනාකම රු. | විස්තරය |
|---|---|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - හෝමාගම | 1 | 2022.09.08 | නියදලෙග්‍රාම සංවර්ධන සමිතිය GREEN HOUSE - MEEGODA | 86,087.43 | ව්‍යාපෘතියෙ අඩුපාඩු පවතින බවට කොන්ත්‍රාත්කරු දැනුවත් කරන ලද අතර එම අඩුපාඩු සති 02 ක් ඇතුලත නිරවුල් කරන බවට කොන්ත්‍රාත් කරු විසින් දැනුම් දි ඇත. ඒ අනුව එම අඩුපාඩු නිවැරදි කළ පසු නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබේ. |
| | | 1 | 2022.09.23 | RENOVATION OF LAB AT BH HOMA AMA | 97,994.33 | |
| | | 1 | 2022.10.31 | RENOVATION OF LAB AT BH HOMAGAMA | 117,535.40 | |
| | **මුළු එකතුව** | **3** | | | **301,617.16** | |

නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)

ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී /

ප්‍රාදේශීය ඉංජිනේරු

| | | | |
|---|---|---|---|
| | | හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ වසර දෙක ඉක්ම වූ තැන්පතු 03 සඳහා දැනට පවතින අඩුපාඩු සම්පූර්ණකර දෙන ලෙස නියමිත දිනක් සඳහන් කර එම දිනට පෙර වැඩ අවසන් කරන ලෙස අදාල කොනත්‍රාත් කරුට ලියාපදිංචි තැපැලෙන් ලිපියක් යොමු කර ඊට ප්‍රතිචාර නොමැති නම් වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙතින් අදාල අඩුපාඩු සකස් කරවා ඊට අදාල මුදල ගෙවා ඉතිරියක් ඇතොත් මුල් කොනත්‍රාත්කරුට එම ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදේස් ලබා දෙන ලදි. | |
| 04 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි පිහිටි භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම | මීගමුව නව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩම සහ පැරණි කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා මැනුම් ගාස්තු ගෙවීමෙන් පසු අදාල මැනුම් කටයුතු 2024.07.31 දින සිදු කර ඇති නමුත් මේ දක්වාත් පිඹුරුපත් ලබා දී නොමැති බව මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු ගේ අංක CSO/ENG/13/5 සහ 2024.11.08 ලිපියෙන් දැනුම් දී ඇත.<br><br>මේ සම්බන්ධයෙන් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් 2024.10.30 දිනැති ලිපිය මගින් අදාල පිඹුරුපත් කඩිනමින් ලබා දෙන මෙන් ජාඇල ප්‍රාදේශීය මිනින්දෝරු අධිකාරි වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>මැනුම් කටයුතු සිදු කලද තවම පිඹුරුපත් ලැබී නොමැති බැවින් නැවත නැවත ප්‍රාදේශීය ලේකම්ව දැනුවත් යොමු කරන ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ගේ අංක CSWP/ADM/16-22/FI/03-06 (A) සහ 2024.09.05 දිනැති ලිපිය මගින්, මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන ගොස් භාවිතයට නොගෙන පවතින පැරණි ගොඩනැගිල්ල සහ පිවිසුම් මාර්ගය ඉල්ලා සිටින අවස්ථාවකදී ආපසු ලබාදීමේ පදනම මත තාවකාලිකව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ පරිහරණයට ලබා දීමට අනුමැතිය ලබාදී ඇත.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ අංක CSWP/ENG-ADM/41-6/FI/1 සහ 2024.09.26 දිනැති ලිපිය මගින් උක්ත ගොඩනැගිල්ල සහ පිවිසුම් මාර්ගය ඉල්ලා සිටින අවස්ථාවකදී ආපසු ලබාදීමේ පදනම මත තාවකාලිකව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ පරිහරණය සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු වෙත දන්වා ඇත.<br><br>මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක CSO/ENG/5/13/MA01/31/2024 සහ 2024.09.26 දිනැති ලිපිය මගින්, මෙම ගොඩනැගිල්ල පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙත විධිමත් පරිදි පවරා දීම සඳහා සුදුසු දිනයක් දන්වන මෙන් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු වෙත දන්වා ඇත.<br><br>පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි ගේ අංක PRDA/WP/GM-CS/ Ministry සහ 2024.10.09 දිනැති ලිපිය මඟින්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ මඟින්, මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන යනු ලැබූ පැරණි ගොඩනැගිල්ල ඇතුළත දිරාපත්වී හා අබලන් වී ඇති බැවින් අළුත් වැඩියා කිරීමකින් තොරව භාවිතයට ගත නොහැකි බැවින් එම ස්ථානයේම නව ගොඩනැගිල්ලක් ඉදිකර විධායක ඉංජිනේරු කාර්යාලය ස්ථාපිත කිරීම සුදුසු බව යෝජනා කර ඇති | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | අවිස්සාවේල්ල ගොඩනැගිල්ල<br><br><br><br>ඉංජිනේරු කාර්යාංශයට අයත් නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීම | අතර, තාවකාලිකව ආපසු ලබා ගැනීමේ පදනම මත ලබා දී ඇති මෙම ස්ථානයේ ස්ථිර ගොඩනැගිල්ලක් අධිකාරිය වියදමින් ඉදිකිරීම ගැටළු සහගත වන බැවින් මෙම ඉඩම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ස්ථිරව පවරා දෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>මෙම ගොඩනැගිල්ල පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට තාවකාලිකව පැවරීම සම්බන්ධයෙන් නැවත විමසීමක් කිරීමටත් ඔවුන්ට එම ගොඩනැගිල්ල අවශ්‍ය නොවෙනම් නම් වෙනත් කාර්යාලයකට මෙම ගොඩනැගිල්ල ලබාදීමට කටයුතු කරන ලෙසත් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි.<br><br>2024 වර්ෂයේ II කාර්තුවෙහි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කර තිබූ පරිදි, එකඟ වූ දිනයට එනම් 2024.07.31 දිනට මෙම ගොඩනැගිල්ල භාරනොදුන් බැවින් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2024.09.13 දින රැස්වීමක් තීරණය කරන ලදි.<br><br>නමුත් 2024.09.21 දින ජනාධිපතිවරණ මැතිවරණය පැවැත්වුණු බැවින් මැතිවරණ රාජකාරි කටයුතුවලට අදාල පාර්ශවයන් කිහිපයක් සම්බන්ධ වීම මත මෙම රැස්වීම කල් දැමීමට සිදුවූ අතර 2024.10.23 දින ,2024.10.29 දින,2024.11.07 දින වශයෙන් එම දිනය වෙනස් වූ අතර පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව නැවත දිනයක් ලබා දීමට නියමිත බව ප්‍රධාන ලේකම්ගේ අදාල විෂය නිලධාරිනිය විසින් දුරකථන මාර්ගයෙන් දැනුම් දෙන ලදි.<br><br>බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට දිනයක් ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කිරීමය තීරණය විය.<br><br>නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරීමට අදාල මැණුම් කටයුතු සම්බන්ධයෙන් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙත සිහි කැඳවීමක් යවා ඇති නමුත් මේ දක්වාත් එයට පිළිතුරක් ලැබී නොමැත.<br><br>දැනට භෞතිකව පදිංචියක් රහිත නිල නිවස අළුත්වැඩියා කිරීමට යටත්ව මේ වන විටත් අදාල නිලධාරියා විසින් කුළිය නිසි පරිදි අවිස්සාවේල්ල රෝහල වෙත ගෙවන බව හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක CSO/ENG/5/04/CMSO/Qua(H)/2024 සහ 2024.11.25 ලිපිය මගින් දන්වා ඇත.<br><br>නිලනිවාස පිහිටි බිම්වල සැලසුම් පිටපත් ලිපි ගොනු වල නොමැති බැවින් අදාල නිල නිවාස වල පිඹුරු සකස් කිරීම සඳහා සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙතින් මිණුම්දෝරු දෙපාර්තමේන්තුව වෙත මැණුම් නියෝග නිකුත් කරන ලෙස ඉල්ලීම සම්බන්ධයෙන් දුරකථනයෙන් විමසීම කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරී/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය | මේ වනවිට ඉංජිනේරු කාර්යාංශයේ සියළුම අංශයන්හි ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) භාවිතා කරමින් ලැබෙන ලිපි සහ යවන ලිපි Scan කර ගබඩා කිරීම සිදු කරනු ලබන අතර, Process Automation ක්‍රියාවලියේ තවදුරටත් පවතින අඩුපාඩු සම්බන්ධයෙන් තොරතුරු සම්පත් අධිකාරිය වෙත දන්වා ඇත. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | (DMS) | මීට අමතරව ඉංජිනේරු කාර්යාංශයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ නිවාඩු අයදුම් කිරීමේ කටයුතු 2024.10.01 වන දින සිට මෘදුකාංග පද්ධතිය (DMS) හරහා සිදු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරුගේ අංක CSWP/ENG-ADM/32-7/FI/1(B) හා 2024.09.27 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇත.<br><br>නිවාඩු අයදුම් කිරීමේ කටයුතු ද මෙම මෘදුකාංග පද්ධතිය (DMS) හරහා සිදු කිරිමේදි ද මේවන විට ගැටළු පැන නැගී ඇති බවත් රාජකාරි පහසුකරවීම සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ නිලධාරිනියක 2024.08.13 දින සිට අප කාර්යාංශයට අනුයුක්ත කෙරුවද එම නිලධාරිනියගේ සහයෝගය ඇතිවත් මෙහි රාජකාරි කටයුතු කිරීම ගැටළුකාරී වි ඇති බව අංශ ප්‍රධානින් ප්‍රකාශ කරන ලදි.<br><br>මෙම මෘදුකාංග පද්ධතිය මඟින් රාජකාරි කටයුතු සිදුකිරිම සම්බන්ධයෙන් ඇතිව ඇති ගැටළුකාරි තත්ත්වය සම්බන්ධයෙන් අදාල අංශ මඟින් ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස සියලුම අංශ ප්‍රධානීන් වෙත නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) උපදෙස් දෙන ලද අතර මේ සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිව දැනුවත් කිරිමටත් තීරණය විය.<br><br>මෘදුකාංග පද්ධතිය මඟින් බලාපෙරොත්තු වන්නේ රාජකාරි කටයුතු පහසු කිරිමක් වන බැවින් මෘදුකාංග පද්ධතිය මඟින් රාජකාරි තවත් වැඩිවිමක් නම් එය ඵලදායි නොවන බව රජයේ විගණක හා අභ්‍යන්තර විගණක ද තහවුරු කරන ලදි. | |
| 06 | කළුතර පානදුර උපාධ්‍යා විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරිම සම්බන්ධව | කළුතර පානදුර උපාධ්‍යා විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරිම සම්බන්ධ තාක්ෂණික වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවත්, අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් විසින් එම වාර්තාව 2024.10.22 ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි.<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් විසින් ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද ලිපියේ ඡායා පිටපතක් ඉංජිනේරු කාර්යාංශය වෙත එවන ලෙස පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු වෙත නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ / පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු |

## 2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | සමහර ව්‍යාපෘති ඉංජිනේරු කාර්යාංශයෙන් බාහිරව වෙනත් ආයතනවලට ලබා දි ඇති අතර (මාර්ග සංවර්ධන අධිකාරියට) එම ආයතනයේ ක්‍රියාත්මක බලධාරිත්වය යටතේ එම ව්‍යාපෘති වෙනත් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදි ඇති බවත්, ඒ අනුව මෙම කොන්ත්‍රාත් අධීක්ෂණය කරන්නේ කවුරුන්ද යන්න හා එම අධීක්ෂණය ඉංජිනේරු කාර්යාංශයට ලබා ගැනීමේ හැකියවාක් නොමැතිද යන්න විමසන ලදි. |
| 2 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී සමිතිවලට කොන්ත්‍රාත් ලබා දිමට වඩා තරඟකාරි මිල ගණන් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරිමට වැඩි අවධානයක් යොමු කරන ලෙස පෙන්වා දෙන ලදි. සමහර ප්‍රදානයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කිසිම අදාලත්වයක් නොමැති සමිතිවලට ලබාදි ඇති බව නිරීක්ෂණය වු බව. |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනයේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය ඉතා සතුටුදායක බව |
| 2. | 2023 භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර අවසන් කර ඇති බවත් 2024 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීම මෙ වර්ෂය අවසන් වීමට පෙර නිම කරන ලෙසත්. |
| 3. | PMS දත්ත පද්ධතියට වැරදි තොරතුරු ඇතුලත් කර ඇති බව, |
| 4. | බස්නාහිර පළාත් ගොඩනැගිලි සංකීර්ණයේ විදුලි බිල තව දුරටත් අඩුකර ගැනීමට හැකියාවක් නොමැතිද යන්න විමසන ලදී. |

**අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | |

2024.12.31 වන විට ව්‍යාපෘතිවල වැඩ අවසන් කරන ලෙසත්, වෙන් කල මුදල් නිසි පරිදි වියදම් කරන ලෙසත්, විගණනයෙන් පෙන්වා දි කරුණු පිළිපදිමින් ඊට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කරන ලෙසත් ඒ අනුව කාර්යාල කටයුතු හොඳින් කරගෙන යන ලෙසටත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලද අතර 2024 වර්ෂයේ අවසන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම බවත්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා අදාල කරුණු සාකච්ඡා කිරීම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් රජයේ විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියපල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 4.00 ට පමණ අවසන් කරන ලදි.

ඉංජි.ජේ.ආර්.අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

ඉංජි. ජේ.ආර්. අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
අංක 204,
බත්තරමුල්ල.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com